www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ මැතිවරනය: දෙමල දේශපාලනඥයෝ යුදවාදීන් පසුපස පෙළ ගැසෙති

## Sri Lankan election: Tamil politicians line up behind warmongers

**සුභාෂ් සෝමචන්ද්‍රන් විසිනි**

**2010 ජනවාරි 11**

**බෙ**දුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ දේශපාලන හඬ ලෙස ක්‍රියා කල දෙමල ජාතික සන්ධානය (ටීඑන්ඒ) ජනවාරි 26 වන දා පැවැත්වෙන රටේ ජනාධිපතිවරනයේ දී ජෙනරාල් සරත් ෆොන්සේකාට සහාය දීම එය තම දේශපාලනයට ම එල්ල කර ගන්නා දෝෂාරෝපනයක් හා සමාන ය.

2006 ජුලි මාසයේ දී ජනාධිපති මහින්ද රාජපක්ෂ යලි ආරම්භ කරන ලදුව පසු ගිය මැයි මාසයේ දී එල්ටීටීඊයේ පරාජයෙන් අවසන් වූ සිවිල් යුද්ධය නිර්දය ලෙස කර ගෙන යාම සම්බන්ධයෙන් රටේ හමුදාපතිව සිටි ෆොන්සේකා වගකිව යුතු ය.

එක්සත් ජාතික පක්ෂය (එජාප) සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) යන විරුද්ධ පක්ෂවල "පොදු අපේක්ෂකයා" වන ෆොන්සේකාට සහාය දීමට පක්ෂයේ බහුතරය තීන්දු කල බව ටීඑන්ඒ නායක ආර්. සම්බන්ධන් පසු ගිය සතියේ නිවේදනය කලේ ය. මාධ්‍ය වාර්තාවලින් කියැවෙන පරිදි, මීට එකඟ නොවුනු ටීඑන්ඒ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කිහිප දෙනෙක් රාජපක්ෂට සහාය දෙති.

දෙදෙනාගෙන් කාට සහාය දිය යුතු ද යන්න උඩ දැන් ටීඑන්ඒය භේද භින්න වී සිටී. සාපරාධී යුද්ධය කර ගෙන ගියේ රාජපක්ෂ සහ ෆොන්සේකා යන දෙදෙනා ම වන අතර, යුද අපරාධ සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් මුලුමනින් ම උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් දෙදෙනා ම වගකිව යුතු ය. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව යුද්ධයේ අවසන් මාසවල දී එල්ටීටීඊ ප්‍රදේශයට වග විභාගයක් නැතිව එල්ල කල මිලිටරි ප්‍රහාරවලින් සිවිල් වැසියෝ 7,000කට වැඩි සංඛ්‍යාවක් මරුමුවට පත් වූහ. අනතුරුව, හුදෙක් දෙමල ජාතිකයන් වීම සහ එල්ටීටීඊ පාලන ප්‍රදේශවල ජීවත් වීමේ පදනම මත 280,000කට ආසන්න ජනයා සිර අඩස්සියෙහි තැබීමට ජනාධිපතිවරයා ද ඔහුගේ ජෙනරාල්වරයා ද මූලිකත්වය ගත්හ.

ෆොන්සේකාට දෙන සහාය යුක්ති සහගත කරමින් නිකුත් කල පිටු දෙකක ප්‍රකාශයේ දී, යුද්ධය ගැන වත් තමන් කලින් එල්ටීටීඊයට දුන් සහාය ගැන වත් ටීඑන්ඒය සෘජුව කිසිවක් සඳහන් නොකලේ ය. ජෝසප් පරරාජසිංහම්, එන්. රවිරාජ් සහ කේ. සිවනේසන් යන තම පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තිදෙනා ඝාතනය කිරීම ගැන සඳහන් කල මුත් ඔවුන් ඝාතනය කලේ ෆොන්සේකා සහ රාජපක්ෂ වගකීම දැරූ මිලිටරියේ සහාය ඇතිව ක්‍රියා කල ඝාතක කල්ලි ය යන කරුන එය සඳහන් නොකලේ ය. පසු ගිය සිව් වසර ඇතුලත දී, පුවත්පත් කලාවේදීන් ද දේශපාලනඥයන් ද ඇතුලු සිය ගනනක් ජනයා ඒ අයුරින් ඝාතනයට හෝ "අතුරුදන් වීමට" ලක්ව ඇත.

දෙමල ජනයා සම්බන්ධයෙන් ගත් විට "ක්ෂනිකව උත්සුක විය යුතු කාරනා" ලෙස තමන් විස්තර කල දෙය ගැන, විශේෂයෙන් ම "කල් පවත්නා දේශපාලන විසඳුමක්" සඳහා පවතින අවශ්‍යතාව ගැන ටීඑන්ඒ නායක සම්බන්ධන් අවධානය යොමු කලේ ය. "දේශපාලන විසඳුමක්" යන්නෙන් ටීඑන්ඒය අදහස් කරන්නේ කොලඹ දේශපාලන සංස්ථාපිතය සමග දෙමල ප්‍රභූවේ අවශ්‍යතා සැපිරෙන ගනුදෙනුවකට එලඹීම යි. 26 වසරක යුද්ධයෙන් ජීවිත මුලිනුදුරා දමනු ලැබ තිබෙන දෙමල ජනතාවගේ දැවෙන සාමාජික අවශ්‍යතා සැපිරීම හෝ පලමු කොට ගැටුමට තුඩු දුන් හේතුව වන මුල් බැස ගත් රාජ්‍ය වෙනස්කම් කිරීම අවසන් කිරීම සමග ඊට කිසිදු සම්බන්ධයක් නැත.

ඇතැම් ටීඑන්ඒ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනාගෙන් එක් අයෙකුට වත් සහාය දීමේ වුවමනාවක් නැති බවත් නමුත් "රාජපක්ෂ ව්‍යර්ථ කල හැකි එක ම අර්ථාන්විත ක්‍රමය ෆොන්සේකාට ඡන්දය දීම" යැයි බහුතරය තීන්දු කොට

ඇති බවත් සම්බන්ධන් ආරක්ෂාකාරීව පැහැදිලි කලේ ය. දේශපාලන විසඳුමක් දෙසට කිසිදු ප්‍රගතියක් අත් කර නොගත් රාජපක්ෂ සමග සසඳන විට ෆොන්සේකා "අඩු නපුර" යැයි පින්තාරු කිරීමට ඔහු උත්සාහ කලේ ය. අල්ලා ගත් එල්ටීටීඊ ප්‍රදේශ තුල සිංහල ජනපද පිහිටුවීමේ ආන්ඩුවේ සැලසුම් — මෙය දුප්පත් සිංහල සහ දෙමල ගොවි ජනයා එකිනෙකාට එරෙහිව පිහිටුවා වාර්ගික ආතතීන් අවුලුවන පියවරකි — ද ඔහු විවේචනය කලේ ය.

අනෙක් අතට, සම්බන්ධන් කියන පරිදි ෆොන්සේකාට "බිම් මට්ටමේ තත්ත්වය වැටහෙයි," ඔහු "රට තුල සාමාන්‍ය තත්ත්වය සහ ස්ථිර සාමය නැවත ඇති කිරීම සඳහා දේශපාලන විසඳුමක් අවශ්‍ය බව පිලිගෙන ඇත." දෙමල ජනයාගේ ඡන්ද දිනා ගැනීමට ප්‍රයත්න දරන ෆොන්සේකා පසු ගිය සතියේ යාපනයෙහි සංචාරයක නිරත වී, මිලිටරියේ අධිආරක්ෂිත කලාප සීමා කරන බවටත් ආර්ථික සංවර්ධනය ගෙන එන බවටත් දෙමල සිවිල් වැසියන් යලි පදිංචි කරන බවටත් පොරොන්දු විය.

ගමනාගමනයට පනවා ඇති සීමාවන් සහ ඇඳිරි නීතිය ලිහිල් කිරීම ද ඇතුලුව දෙමල සුලුතරය නැලවීම සඳහා ප්‍රයත්න දරමින් රාජපක්ෂ දෙන පොරොන්දුවලට වඩා මෙම පොරොන්දු විශ්වසනීය නැත. රැඳවුම් මධ්‍යස්ථානවල රඳවා ගෙන සිටින සිවිල් වැසියන්ට ඒවායින් පිට වී යාමට "නිදහස" ලැබෙන බව මැතිවරනයට සූදානම් වන කාලයේ දී ජනාධිපතිවරයා නිවේදනය කලේ ය. එහෙත් නිදහස් කල රැඳවියන්ට සැපයුනේ සොච්චම් සහායක් වන අතර, ඔවුන් ජීවත් වන්නේ ආරක්ෂක අංශවල නිරන්තර විමසුම් ඇසට ලක්ව ය. දිවයිනේ උතුර සහ නැගෙනහිර ස්ථිර මිලිටරි වාඩි ලා ගැනීමකට යටත් කොට ඇත. තව ද, අවශ්‍ය සම්පත් නැතිකම නිසා සහ යාමට තැනක් නැතිකම නිසා 100,000කට ආසන්න ජනයා තව මත් කඳවුරුවල ම වෙසෙති.

ෆොන්සේකා නියෝජනය කරන්නේ "අඩු නපුර" යැයි කියා පෑම විහිලුවකි. නිර්දය භාවය සහ වාර්ගික අදහස් සම්බන්ධයෙන් ජෙනරාල්වරයා කුප්‍රකට ය. 2008 දී ඔහු කැනේඩියානු පුවත්පතකට මෙසේ කී යඃ "ශ්‍රී ලංකාව අයිති සිංහලයන්ට ය කියා මා දැඩිව විශ්වාස කරනවා. ඒත් එහි සුලු ජාතීන් ඉන්නවා, අප ඔවුනුත් අපේ ම ජනතාව හැටියට සලකනවා.... ඔවුන්ට අපත් එක්ක මේ රටේ ජීවත් වෙන්න පුලුවන්. හැබැයි සුලුතරයක් ය කියන බොරු හේතුව යොදා ගෙන අයුතු දේවල් ඉල්ලන්න ඔවුන් උත්සාහ නොකල යුතු යි." තමන් කී දේවල් වැරදි ලෙස උපුටා දක්වා ඇතැයි ඔහු දැන් කියයි.

මේ සියලු පොරොන්දුවලින් ප්‍රධාන කොට ම පාහේ උත්සාහ කරන්නේ, ෆොන්සේකා දිනුවත් රාජපක්ෂ දිනුවත් මැතිවරනය අවසන් වූ වහා ම වැඩ කරන ජනයාගේ ජීවන තත්ත්වයන් මත දැවැන්ත ප්‍රහාරයක් එල්ල වන්නේ ය යන කරුන යට ගැසීමට යි. වඩ වඩාත් නරක අතට හැරෙමින් පවතින රටේ ආර්ථික අර්බුදය විසඳීම සඳහා පෞද්ගලීකරනය ද රජයේ වියදම් බරපතල ලෙස කප්පාදු කිරීම ද ඇතුලු දුර දිග යන ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු කල යුතු යැයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අවධාරනය කරයි. මෙම කම්කරු පන්ති විරෝධී න්‍යාය පත්‍රයට එරෙහිව මතු වන ඕනෑ ම දේශපාලනික විරුද්ධත්වයක් මැඩීමට රාජ්‍ය යන්ත්‍රය මෙහෙයවීම සඳහා ෆොන්සේකාට වැඩි හැකියාවක් ඇතැයි දකින ඇතැම් පාලක පන්තික කොටස් ඔහුට සහාය දෙයි.

ටීඑන්ඒය ෆොන්සේකා පසුපස පෙල ගැසීමෙන් — හෝ එහි සුලුතරයක් රාජපක්ෂ පසුපස පෙල ගැසීමෙන් — අවධාරනය වන්නේ ටීඑන්ඒහි ම ද එල්ටීටීඊයේ ද දේශපාලනය පත්ව තිබෙන ආවෘත අන්තය යි. දිවයිනේ උතුරෙහි සහ නැගෙනහිරෙහි වෙන ම ධනපති රාජ්‍යයක් ඇටවීම පිලිබඳ එල්ටීටීඊයේ ඉල්ලීමෙන් හැම විට ම නියෝජනය වූයේ දෙමල ධනේශ්වරයේ අවශ්‍යතා මිස දෙමල මහජනතාවගේ අවශ්‍යතා නො වේ. එක්සත් ජනපදයෙහි සැප්තැම්බර් 11 වන දා ප්‍රහාරයෙන් පසුව, ජාත්‍යන්තර වශයෙන් එල්ල වූ දැඩි පීඩනය යටතේ වෙන ම ඊලමක් පිලිබඳ සිය ඉල්ලීම අත් හල එල්ටීටීඊය, 2002 මුල දී සටන් විරාමයකට අත්සන් තබා ජාත්‍යන්තර අනුග්‍රහය යටතේ පැවැත්වුනු සාම කතාවලට පිවිසියේ ය.

විවර වෙමින් පවතින්නේ යැයි තමන් දුටු ආර්ථික සහ දේශපාලනික ඉඩ ප්‍රස්තාවල වාසිය ඩැහැ ගනු වස් 2001 දී ධනේශ්වර දෙමල පක්ෂ ගනනාවක් එක්ව ටීඑන්ඒය ගොඩ නගා ගත්තේ ය. ඊනියා සාම කතා සාර්ථක වූයේ නම් උතුරට සහ නැගෙනහිරට සැලකිය යුතු බලය පැවරීමක් සිදු වන්නට ඉඩ තිබින. කොලඹ ආන්ඩුව දිවයින දකුනු ආසියාවේ ආයෝජන මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කිරීමට උත්සාහ කරද්දී දෙමල දේශපාලනඥයන් සහ ව්‍යාපාරිකයන්

බලය පිලිබඳ තැරැව්කරුවන් ද ගනුදෙනු සකස් කරන්නන් ද බවට පත් වන්නට ඉඩ තිබින. වෙනත් වචනවලින් කිව හොත්, සිංහල සහ දෙමල ප්‍රභූන් සිටියේ කම්කරු පන්තිය අන්‍යෝන්‍යව සූරා කෑ හැකි බලය බෙදා ගැනීමේ සැකැස්මක් පිලිබඳ බලාපොරොත්තුවෙනි.

ඊනියා සාම ක්‍රියා දාමය, 1948 දී නිදහස ලත් තැන් පටන් කොලඹ දේශපාලනඥයන්ගේ ආවේනික ලක්ෂනයක්ව තිබෙන වාර්ගික දේශපාලනය නමැති මඩ ගොහොරුවෙහි එරින. යුද්ධය යලි ආරම්භ කිරීම කරා ලුහුටා යාමේ පැහැදිලි සංඥාවක් නිකුත් කරමින් 2005 ජනාධිපතිවරනය වර්ජනය කිරීමට නියෝග කල එල්ටීටීඊය රාජපක්ෂගේ පටු ජයග්‍රහනයට සක්‍රියව සහාය විය. රාජපක්ෂ වඩ වඩාත් එලිපිට යුද්ධය සඳහා ලකලෑස්ති වෙද්දී එල්ටීටීඊය සාම කතා යලි ආරම්භ කරන ලෙස "ජාත්‍යන්තර ප්‍රජාවට" ආයාචනය කල මුත්, එක්සත් ජනපදය ද යුරෝපා සංගමය ද ඉන්දියාව ද යන මේ සියල්ලෝ රාජපක්ෂට සහාය දුන්හ.

එල්ටීටීඊය ලද මිලිටරි පරාජය ගලා ආවේ ශ්‍රී ලංකාවේ සහ ජාත්‍යන්තර කම්කරු පන්තියට ආයාචනය කිරීමට එය ඓන්ද්‍රීයව ම අපොහොසත් වීම නිසා ය. දෙමල ජනයා අතර ඊට පැවති සහාය හීන වී යද්දී එය සිය පාලනය යටතේ පැවති ප්‍රදේශය තුල ඊට එරෙහිව පැන නැගි සියලු දේශපාලන විරුද්ධත්වයන් නිර්දය ලෙස මර්දනය කලේ ය. සැබවින් ම ටීඑන්ඒය එල්ටීටීඊයේ බිඳ වැටීම ගැන කිසිදු විශ්ලේෂනයක් සිදු කලේ නැත. එහෙත් දැන් එය කොලඹ දේශපාලන සංස්ථාපිතය තුලට යලි ඒකාග්‍ර වී ගනිමින් අවධානය දිනා ගෙන ඇත. වෙන ම රාජ්‍යයක් හෝ බලය පැවරීමේ ගනුදෙනුවක් වෙනුවට "දේශපාලන විසඳුමක්" හරහා දෙමල ධනේශ්වරයේ අවශ්‍යතා සුරක්ෂිත කර ගැනීමට උත්සාහ කරමින්, ටීඑන්ඒ නායකයෝ රාජපක්ෂත් ඔහුගේ ආන්ඩුවත් සමග පයුරුපාසනයෙහි යෙදුනහ.

බොහෝ ටීඑන්ඒ නායකයන් ෆොන්සේකාට හෝ රාජපක්ෂට සහාය දෙද්දී ඊට එකඟ නොවූ ටීඑන්ඒ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන කේ. සිවාජිලිංගම් නව සමසමාජ පක්ෂයේ (නසසප) හිටපු රැඩිකලුන්ගේ සහාය ඇතිව ජනාධිපතිවරන අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වී සිටී. ඔහුගේ ක්‍රියා මාර්ගය ෆෙඩරල් රාමුවක් තුල බලය බෙදා හරින දේශපාලන විසඳුමක් ඉල්ලා සිටින ටීඑන්ඒහි ක්‍රියා මාර්ගයෙන් මූලිකව වෙනස් නො වේ. සිවාජිලිංගම් උත්සාහ කරමින් සිටින්නේ කවුරුන් දිනුවත් ඊලඟ ආන්ඩුව සමග වඩා හොඳ ගනුදෙනුවකට යනු පිනිස දෙමල ජනයා අතර රාජපක්ෂට සහ ෆොන්සේකාට පවතින තදබල විරුද්ධත්වයේ වාසිය ඩැහැ ගන්නට ය.

මෙම මැතිවරනය තුල දී පොදුවේ සිංහල, දෙමල සහ මුස්ලිම් යන සියලු වැඩ කරන ජනයාගේ ස්වාධීන පන්ති අවශ්‍යතා වෙනුවෙන් සටන් වදිමින් සිටින එක ම පක්ෂය සමාජවාදී සමානතා පක්ෂය (සසප) යි. යුද අපරාධ සහ දෙමල සුලුතරය පීඩාවට පත් කිරීම හරහා අත් කර ගත් තාවකාලික සාමය අනාගත වාර්ගික ආතතීන්ට සහ ගැටුමට තුඩු දෙන්නක් පමනක් වන බවට සසප අපේක්ෂක විජේ ඩයස් අනතුරු අඟවා ඇත. යුද්ධය ආරම්භ කිරීම සහ එය දිගින් දිගට පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් අනුප්‍රාප්තිකව බලයට පත් වුනු කොලඹ ආන්ඩු වගකිව යුතු වන මුත්, එල්ටීටීඊයේ වාර්ගික දේශපාලනය සහ විධික්‍රම කම්කරු පන්තිය බෙදා ලීමෙහි ලා ආධාරක විය.

26 වසරක යුද්ධය වනාහි සමස්ත ශ්‍රී ලාංකික ධනේශ්වරයට ම එරෙහිව එල්ල වන දෝෂාරෝපනයකි. වැඩ කරන ජනයාගේ මූලික ප්‍රජාතන්ත්‍රවාදී සහ සාමාජික අයිතීන් සහතික කිරීමෙහි ලා එය ඓන්ද්‍රීයව ම අපොහොසත් ය. ජාතිකවාදයේ සහ වර්ගවාදයේ සියලු රූපාකාරයන් ප්‍රතික්ෂේප කරන ලෙසත් තම පොදු පන්ති අවශ්‍යතා වෙනුවෙන් සටන් වැදීමට එකමුතු වන ලෙසත් සසපය කම්කරුවන්ගෙන් සහ තරුනයන්ගෙන් ඉල්ලා සිටී. කම්කරුවන්ගේ සහ ගොවීන්ගේ ආන්ඩුවක් සහ සමාජවාදී ක්‍රියා මාර්ගයක් සඳහා කරන වඩා පුලුල් අරගලයේ කොටසක් ලෙස සියලු දෙනා උදෙසා ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් තහවුරු කිරීමට සමත් වන එක ම සමාජ බලවේගය කම්කරු පන්තිය යි. උතුරෙහි සහ නැගෙනහිරෙහි මිලිටරි වාඩි ලා ගැනීම වහා ම සහ කොන්දේසි විරහිතව අවසන් කරන ලෙසත් වෙනස්කම් කරන සහ මර්දනකාරී ව්‍යවස්ථාව ද නීති ද අහෝසි කරන ලෙසත් තම බිඳ වැටුනු ජීවිත යලි ගොඩ නගා ගැනීම සඳහා යුද කලාපවල ජීවත් වන කම්කරුවන්ට සහ ගොවීන්ට සහාය වනු වස් රුපියල් බිලියන ගනනින් වෙන් කරන ලෙසත් සසපය ඉල්ලා සිටී.

අපගේ අපේක්ෂකයා වන විජේ ඩයස්ට සහාය දෙන ලෙසත් පක්ෂයේ උද්ඝෝෂනයට ක්‍රියාකාරීව සහභාගි වන ලෙසත් සසපය වැඩ කරන ජනයාගෙන් සහ තරුනයන්ගෙන් ඉල්ලා සිටී.

© www.wsws.org